7 ශ්‍රේණිය ගණිතය

06 ඒකකය - 2022

කාලය

සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

07 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

០៦. කාලය

6.1 කාලය මනින ඒකක

- 2022 - 06 - 25 දවස යනු, 2022 - 06 - 25 වේලාව 00:00 සිට 2022 - 06 - 25 වේලාව 24:00 දක්වා කාල පරිච්ඡේදය යි.
- එක් දිනයක් අවසාන වන මොහොතේ දී ම ඊළඟ දිනය පටන් ගනී. එම නිසා 2022 - 06 - 25, වේලාව 24:00 යනු 2022 - 06 - 26 වේලාව 00:00 දැක්වෙන වේලාවම වේ.
- 2022 වසර යනු, 2022 - 01 - 01 සිට 2022 - 12 - 31 තෙක් කාල පරිච්ඡේදය යි.
- වර්ෂ වශයෙන් කාලය මැනීමට ඇතැම් ආගමික ශාස්තෲවරුන්ගේ උපත හෝ විපත සිදු වූ කාලවකවානුවක් පදනම් කරගනු ලැබේ. අන්තර්ජාතික සම්මුතිය වන්නේ කිතු උපත සිදු වී ඇති වර්ෂය යි. කිතු උපතට පසු ව යෙදන වර්ෂ ක්‍රිස්තු වර්ෂ (ක්‍රි.ව.) ලෙස ද කිතු උපතට පෙර වර්ෂ ක්‍රිස්තු පූර්ව (ක්‍රි.පූ.) ලෙස ද හැඳින්වේ.
- වසර 10ක කාල පරිච්ඡේදයක් දශකයක් ලෙස හඳුන්වනු ලැබේ.

උදාහරණ:- 01

- ✓ ක්‍රි.ව. 0001 සිට - ක්‍රි.ව. 0010 තෙක් - පළමු දශකය වේ.
- ✓ ක්‍රි.ව. 0011 සිට - ක්‍රි.ව. 0020 තෙක් - දෙවන දශකය වේ.
- ✓ ක්‍රි.ව. 1811 සිට - ක්‍රි.ව. 1820 තෙක් - 182 වන දශකය වේ.
- ✓ ක්‍රි.ව. 1951 සිට - ක්‍රි.ව. 1960 තෙක් - 196 වන දශකය වේ.
- ✓ ක්‍රි.ව. 2011 සිට - ක්‍රි.ව. 2020 තෙක් - 202 වන දශකය වේ.

උදාහරණ:- 02

- ✓ ක්‍රි.ව. 1505 අයත් වන්නේ කී වන දශකයට ද?

  1505 ÷ 10 = 150 ඉතුරු 5

  ∴ 151 දශකය

- ✓ ක්‍රි.ව. 2022 අයත් වන්නේ කී වන දශකයට ද?

  2022 ÷ 10 = 202 ඉතුරු 2

  ∴ 203 දශකය

- ✓ ක්‍රි.ව. 2010 අයත් වන්නේ කී වන දශකයට ද?

  2010 ÷ 10 = 201 ඉතුරු 0

  ∴ 201 දශකය

- වසර 100ක කාල පරිච්ඡේදයක් සියවසක් ලෙස හඳුන්වනු ලැබේ. එය ශතවර්ෂයක් ලෙස ද හැඳින්වේ.

උදාහරණ:- 01

✓ ක්‍රි.ව. 0001 සිට - ක්‍රි.ව. 0100 තෙක් - පළමු සියවස වේ.
✓ ක්‍රි.ව. 0101 සිට - ක්‍රි.ව. 0200 තෙක් - දෙවන සියවස වේ.
✓ ක්‍රි.ව. 1801 සිට - ක්‍රි.ව. 1900 තෙක් - 19 වන සියවස වේ.
✓ ක්‍රි.ව. 1901 සිට - ක්‍රි.ව. 2000 තෙක් - 20 වන සියවස වේ.
✓ ක්‍රි.ව. 2001 සිට - ක්‍රි.ව. 2100 තෙක් - 21 වන සියවස වේ.

උදාහරණ:- 02

✓ ක්‍රි.ව. 1505 අයත් වන්නේ කී වන සියවසට ද?
$1505 \div 100 = 15$ ඉතුරු 05
∴ 16 සියවස

✓ ක්‍රි.ව. 2022 අයත් වන්නේ කී වන සියවසට ද?
$2022 \div 100 = 20$ ඉතුරු 22
∴ 21 සියවස

✓ ක්‍රි.ව. 2010 අයත් වන්නේ කී වන සියවසට ද?
$2010 \div 100 = 20$ ඉතුරු 10
∴ 21 සියවස

✓ ක්‍රි.ව. 2000 අයත් වන්නේ කී වන සියවසට ද?
$2000 \div 100 = 20$ ඉතුරු 00
∴ 20 සියවස

✓ ක්‍රි.ව. 2001 අයත් වන්නේ කී වන සියවසට ද?
$2001 \div 100 = 20$ ඉතුරු 01
∴ 21 සියවස

- වසර 1000ක කාල පරිච්ඡේදයක් සහස්‍රකයක් ලෙස හඳුන්වනු ලැබේ.

උදාහරණ:- 01

✓ ක්‍රි.ව. 0001 සිට - ක්‍රි.ව. 100 තෙක් - පළමු සහස්‍රකය වේ.
✓ ක්‍රි.ව. 1001 සිට - ක්‍රි.ව. 2000 තෙක් - දෙවන සහස්‍රකය වේ.
✓ ක්‍රි.ව. 2001 සිට - ක්‍රි.ව. 3000 තෙක් - 3 වන සහස්‍රකය වේ.
✓ ක්‍රි.ව. 3001 සිට - ක්‍රි.ව. 4000 තෙක් - 4 වන සහස්‍රකය වේ.

උදාහරණ:- 02

✓ ක්‍රි.ව. 1505 අයත් වන්නේ කී වන සහස්‍රකයට ද?
1505 ÷ 1000 = 1 ඉතුරු 505
∴ 2 සහස්‍රකය

✓ ක්‍රි.ව. 2022 අයත් වන්නේ කී වන සහස්‍රකයට ද?
2022 ÷ 1000 = 2 ඉතුරු 022
∴ 3 සහස්‍රකය

✓ ක්‍රි.ව. 2010 අයත් වන්නේ කී වන සහස්‍රකයට ද?
2010 ÷ 1000 = 2 ඉතුරු 010
∴ 3 සහස්‍රකය

✓ ක්‍රි.ව. 2000 අයත් වන්නේ කී වන සහස්‍රකයට ද?
2000 ÷ 1000 = 2 ඉතුරු 000
∴ 2 සහස්‍රකය

✓ ක්‍රි.ව. 2001 අයත් වන්නේ කී වන සහස්‍රකයට ද?
2001 ÷ 1000 = 2 ඉතුරු 001
∴ 3 සහස්‍රකය

6.1 අභ්‍යාසය

(1) පහත දැක්වෙන එක් එක් වර්ෂය අයත් වන්නේ කී වන දශකයට දැයි ලියා දක්වන්න.

(i) ක්‍රි.ව. 1856 (ii) ක්‍රි.ව. 1912 (iii) ක්‍රි.ව. 1978 (iv) ක්‍රි.ව. 2004

(2) 22 වන සියවසේ පළමු දිනය හා අවසාන දිනය ලියන්න.

(3) පහත දැක්වෙන එක් එක් වර්ෂය අයත් වන්නේ කී වන සියවසට දැයි ලියන්න.

(i) ක්‍රි.ව. 1796 (ii) ක්‍රි.ව. 1815 (iii) ක්‍රි.ව. 1956 (iv) ක්‍රි.ව. 2024

6.1 අභ්‍යාසය

1.

I. 1856 ÷ 10 = 185 ඉතුරු 6
∴ 186 දශකය

II. 1912 ÷ 10 = 191 ඉතුරු 2
∴ 192 දශකය

III. 1978 ÷ 10 = 197 ඉතුරු 8
∴ 198 දශකය

IV. 2004 ÷ 10 = 200 ඉතුරු 4
∴ 201 දශකය

2. ක්‍රි.ව. 2101 - 01 - 01 දින වේලාව 00:00 සිට ක්‍රි.ව. 2200 - 12 - 31 වැනි දින වේලාව 24:00 දක්වා ඇති කාලය 22 වන සියවස වේ.

3.
I. 1796 ÷ 100 = 17 ඉතුරු 96
∴ 18 සියවස

II. 1815 ÷ 100 = 18 ඉතුරු 15
∴ 19 සියවස

III. 1956 ÷ 100 = 19 ඉතුරු 56
∴ 20 සියවස

IV. 2024 ÷ 100 = 20 ඉතුරු 24
∴ 21 සියවස

6.2 අධික අවුරුද්ද

- පෙබරවාරි මාසයට දින 29ක් ඇති සෑම අවුරුද්දක ම මුළු දින ගණන 366 වේ. එවැනි අවුරුද්දක් අධික අවුරුද්දක් ලෙස හඳුන්වනු ලැබේ.
- යම් වර්ෂයක් දැක්වෙන සංඛ්‍යාව 100 ගුණාකාරයක් නොවේ නම්, එම සංඛ්‍යාව 4න් බෙදේ නම්, එය අධික අවුරුද්දකි.

1. උදා: ක්‍රි.ව. 2008 අධික අවුරුද්දක් ද?
✓ 2008, 100හි ගුණාකාරයක් නොවේ.
✓ 2008 ÷ 4 = 502 නිසා 2008, 4න් බෙදේ.
∴ ක්‍රි.ව. 2008 අධික අවුරුද්දකි.

2. උදා: ක්‍රි.ව. 2022 අධික අවුරුද්දක් ද?
   ✓ 2022, 100හි ගුණාකාරයක් නොවේ.
   ✓ 2022, 4න් නො බෙදේ.
   ∴ ක්‍රි.ව. 2022 අධික අවුරුද්දක් නොවේ.

- 100 ගුණාකාරයක් වන වර්ෂයක් අධික අවුරුද්දක් වන්නේ එය 400න් බෙදේ නම් පමණි.

3. උදා: ක්‍රි.ව. 2000 අධික අවුරුද්දක් ද?
   ✓ 2000 = 100 × 20 නිසා 2000, 100හි ගුණාකාරයකි.
   ✓ 2000 ÷ 400 = 5 නිසා 2000, 400න් බෙදේ.
   ∴ ක්‍රි.ව. 2000 අධික අවුරුද්දකි.

4. උදා: ක්‍රි.ව. 1800 අධික අවුරුද්දක් ද?
   ✓ 1800 = 100 × 18 නිසා 1800, 100හි ගුණාකාරයකි.
   ✓ 1800, 400න් නොබෙදේ.
   ∴ ක්‍රි.ව. 1800 අධික අවුරුද්දක් නොවේ.

- 4හි ගුණාකාරයක් නොවන කිසිදු වර්ෂයක් අධික අවුරුද්දක් නොවේ.

කාලය මනින ඒකක අතර සම්බන්ධතාව තවදුරටත්

✓	තත්පර 60	=	මිනිත්තු 1
✓	මිනිත්තු 60	=	පැය 1
✓	පැය 24	=	දින 1
✓	මාස 12	=	අවුරුදු 1
✓	දින 365	=	අවුරුදු 1
✓	දින 366	=	අධික අවුරුදු 1

- දින 28, 29, 30, 31 බැගින් වූ මාස ඇත. නමුත් දින 30ක් මාස 1ක කාල පරිච්ඡේදයක් ලෙස ගණනය කිරීම්වල දී සලකනු ලැබේ.
- අවුරුදුවලින් දී ඇති කාලයක් දින ගණන්වලින් දැක්වීමේ දී අවුරුදු ලෙස දී ඇති ගණන 365න් ගුණ කළ යුතු ය.
- අවුරුදුවලින් දී ඇති කාලයක් මාසවලින් දැක්වීමේ දී අවුරුදු ලෙස දී ඇති ගණන 12න් ගුණ කරනු ලැබේ.
- දින 30ක් මාසයක් ලෙස සැලකුව ද, අවුරුද්දකට මාස 12ක් ඇති හෙයින් අවුරුද්දකට ඇති දින ගණන දින 30 ඒවා 12ක්, එනම් දින 360ක් යැයි වරදවා තේරුම් නොගත යුතු ය. මාසයකට දින 30ක් ලෙස සැලකුව ද අවුරුද්දකට දින 365ක් ලෙස ගණනය කිරීම්වල දී සලකනු ලැබේ.

6.2 අභ්‍යාසය

(1) පහත දැක්වෙන වර්ෂ අතුරින් අධික අවුරුදු වන වර්ෂ තෝරා ලියන්න.

(i) ක්‍රි.ව. 1896 (ii) ක්‍රි.ව. 1958 (iii) ක්‍රි.ව. 1960
(iv) ක්‍රි.ව. 1400 (v) ක්‍රි.ව. 1600 (vi) ක්‍රි.ව. 2016

(2) (a) පහත දැක්වෙන එක් එක් දින ගණන, මාස සහ දිනවලින් දක්වන්න.

(i) දින 255 (ii) දින 100 (iii) දින 180

(b) අවුරුදු 5කට මාස කීය ද? දින කීය ද?

(3) බස් රථයක් දිනකට ගමන් වාර 4 බැගින් මාස 6ක් තුළ දිනපතා ම ධාවනයේ යෙදුණේ නම් එය ගමනේ යෙදුණු මුළු ගමන් වාර සංඛ්‍යාව කීය ද?

(4) දිනකට බෙහෙත් පෙති 3 බැගින් රෝගියකු මාස 2ක් තුළ දිනපතා බෙහෙතක් ගත යුතු ව ඇත. ඒ සඳහා අවශ්‍ය වන බෙහෙත් පෙති ගණන කීය ද?

(5) දිනපතා අනිවාර්යයෙන් ම පැය 1ක් ව්‍යායාමවල යෙදෙන අයකු

(i) වර්ෂයක දී ඔහු ව්‍යායාම කළ (අවම) පැය ගණන සොයන්න (අධික අවුරුද්දක් නොවන වර්ෂයකි).

(ii) එම කාලය දිනවලින් දක්වන්න.

(6) දිනකට අවම වශයෙන් රුපියල් 5 බැගින් අනිවාර්යයෙන් ම කැටයක දමන අයකුට පහත දැක්වෙන එක් එක් කාලය තුළ එකතු කළ හැකි අවම මුදල සොයන්න.

(i) මාස 6ක දී (ii) අධික අවුරුද්දක දී

6.2 අභ්‍යාසය

1.

I. ✓ 1896, 100හි ගුණාකාරයක් නොවේ.

✓ $1896 \div 4 = 474$ නිසා 1896, 4න් බෙදේ.

∴ ක්‍රි.ව. 1896 අධික අවුරුද්දකි.

II. 1958, 100හි ගුණාකාරයක් නොවේ.
✓ 1958, 4න් නො බෙදේ.
∴ ක්‍රි.ව. 1958 අධික අවුරුද්දක් නොවේ.

III. 1960, 100හි ගුණාකාරයක් නොවේ.
✓ 1960 ÷ 4 = 490 නිසා 1960, 4න් බෙදේ.
∴ ක්‍රි.ව. 1960 අධික අවුරුද්දකි.

IV. 1400 = 100 × 14 නිසා 1400, 100හි ගුණාකාරයකි.
✓ 1400, 400න් නොබෙදේ.
∴ ක්‍රි.ව. 1400 අධික අවුරුද්දක් නොවේ.

V. 1600 = 100 × 16 නිසා 1400, 100හි ගුණාකාරයකි.
✓ 1600 ÷ 400 = 4 නිසා 1600, 400න් බෙදේ.
∴ ක්‍රි.ව. 1600 අධික අවුරුද්දකි.

VI. 2016 , 100හි ගුණාකාරයක් නොවේ.
✓ 2016 ÷ 4 = 504 නිසා 2016, 4න් බෙදේ.
∴ ක්‍රි.ව. 2016 අධික අවුරුද්දකි.

2. a)
I. දින 255 = මාස 8යි දින 15කි.
II. දින 100 = මාස 3යි දින 10කි.
III. දින 180 = මාස 6යි.

b) අවුරුදු 5 = මාස 5 × 12 = මාස 60
අවුරුදු 3 = දින 5 × 365 = දින 1825

3. 4 × 30 × 6 = ගමන් වාර සංඛ්‍යාව 720කි.

4. 3 × 30 × 2 = අවශ්‍ය වන බෙහෙත් පෙති ගණන 180කි.

5.
I. 1 × 365 = ව්‍යායාම කළ (අවම) පැය ගණන 365කි.
II. 365 ÷ 24 = දින 15කි. (පැය 5ක් ඉතිරි වේ.)

6.

I. රුපියල් 5 × 30 × 6 = රුපියල් 900.00 කි.

II. රුපියල් 5 × 366 = රුපියල් 1830.00 කි.

6.3 කාලය ආශ්‍රිත ගණනය කිරීම්

6.3 අභ්‍යාසය

(1) එකතු කරන්න.

(i)

මාස	දින
8	18
+2	11

(ii)

මාස	දින
8	22
+2	16

(iii)

අවුරුදු	මාස	දින
12	6	21
+3	2	19

(iv)

අවුරුදු	මාස	දින
8	9	19
+2	6	23

(2) අඩු කරන්න.

(i)

මාස	දින
6	23
−3	15

(ii)

මාස	දින
6	18
−2	24

(iii)

අවුරුදු	මාස	දින
3	6	15
−2	4	18

(iv)

අවුරුදු	මාස	දින
2	8	12
−1	2	15

(3) දිලීපගේ උපන් දිනය 2003 - 09 - 07
සිතුමිණිගේ උපන් දිනය 2000 - 02 - 04

(i) සිතුමිණි දිලීපට වඩා කොපමණ වයසින් වැඩි දැයි, උපන්දින ඇසුරෙන්, සොයන්න.

(ii) 2018 - 03 - 31 දිනට දිලීපගේ වයසත් සිතුමිණිගේ වයසත් අවුරුදු, මාස සහ දිනවලින් සොයන්න.

(iii) සිතුමිණි දිලීපට වඩා කොපමණ වයසින් වැඩි දැයි, දෙදෙනාගේ වයස් ඇසුරෙන්, සොයන්න.

6.3 අභ්‍යාසය

1.

I. මාස 10 දින 29

II. මාස 11 දින 08

III. අවුරුදු 15 මාස 09 දින 10

IV. අවුරුදු 11 මාස 04 දින 12

2.

I. මාස 03 දින 08
II. මාස 03 දින 24
III. අවුරුදු 01 මාස 01 දින 27
IV. අවුරුදු 01 මාස 05 දින 27

3.

I. අවුරුදු 03 මාස 07 දින 03
II. දිලීපගේ වයස - අවුරුදු 14 මාස 06 දින 24
III. සිතුමිණිගේ වයස - අවුරුදු 18 මාස 01 දින 27
IV. අවුරුදු 03 මාස 07 දින 03

(4) පහත දැක්වෙන්නේ ගුරුවරුන් දෙදෙනකු පාසලක සේවය කළ සේවා කාලයන් වේ.

	සේවයට පැමිණි දිනය	පාසලින් අස් වූ දිනය
විතානගේ මහතා	2001 - 07 - 13	2015 - 11 - 22
රෝහන මහතා	1997 - 03 - 20	2012 - 01 - 10

(i) එක් එක් ගුරුවරයා එම පාසලේ සේවය කළ කාලය සොයා ඒ ඇසුරෙන් වැඩි කාලයක් එම පාසලේ සේවය කළේ කවුරුන් දැයි පෙන්වා දෙන්න.

(ii) වැඩි සේවා කාලයක් ඇති ගුරුවරයාගේ සේවා කාලය, අනෙක් ගුරුවරයාගේ සේවා කාලයට වඩා කොපමණ ප්‍රමාණයක් වැඩිවේ ද?

4.

I. විතානගේ මහතා - අවුරුදු 14 මාස 04 දින 09
රෝහන මහතා - අවුරුදු 14 මාස 09 දින 20
∴ වැඩි කාලයක් එම පාසලේ සේවය කළේ රෝහන මහතා ය.

II. මාස 05 දින 11

(5) ශෂිකාගේ උපන් දිනය 2004 - 08 - 13 වේ. අහේලි ඇයට වඩා අවුරුදු 1යි මාස 8යි දින 25ක් වැඩිමල්ය. අහේලිගේ උපන් දිනය කවරදා ද?

(6) පාසලක් මුල්වරට ආරම්භ කළ දිනය 1928 - 03 - 26 වේ.

(i) එම පාසලට සියවසක් සම්පූර්ණ වන දිනය කවරදා ද?

(ii) ඒ දිනය සඳහා අද සිට තව දින කීයක් තිබේදැයි සොයන්න.

5. 2006 - 05 - 08

6.

I. 2028 - 03 - 26

II. 2028 - 03 - 26
- <u>2022 - 07 - 15</u> ∴ අවුරුදු 5 මාස 08 දින 11
- 0005 - 08 - 11 දින 1932

(7) අමිල 2012 - 02 - 13 දින සිට 2014 - 07 - 27 දින දක්වා ජපානයේත් 2014 - 12 - 17 දින සිට 2015 - 10 - 05 දින දක්වා චීනයේත් කෘෂිකර්මය පිළිබඳ ව පුහුණුවීම්වල යෙදී සිටියේ ය. ඔහු ජපානයේ හා චීනයේ පුහුණුවීම්වල යෙදී සිටි මුළු කාලය සොයන්න.

7. ජපානයේ - අවුරුදු 2 මාස 05 දින 14
චීනයේ - අවුරුදු 0 මාස 09 දින 18
∴ ජපානයේ හා චීනයේ පුහුණුවීම්වල
යෙදී සිටි මුළු කාලය - අවුරුදු 3 මාස 03 දින 02

මිශ්‍ර අභ්‍යාසය

(1) අවුරුදු 10ක් තුළ දී සෑම මසකට වරක් ම සමාන වාරිකයකින් ගෙවීමේ පොරොන්දුව පිට ණය මුදලක් ගත් අයකු පළමු වාර මුදල 2016 - 01 - 01 දින සිදු කළේ නම් අවසාන වාරිකය ගෙවිය යුතු දිනය සොයන්න.

මිශ්‍ර අභ්‍යාසය

1. 2025 - 12 - 01

(2) පාසලක නිවාසාන්තර ක්‍රීඩා තරග සඳහා තෝරා ගන්නා වයස් පිළිබඳ නිර්ණායකය පහත දැක්වේ.
11න් පහළ තරග, 2016 - 03 - 31 දිනට වයස අවුරුදු 11ට අඩු විය යුතු ය.
13න් පහළ තරග, 2016 - 03 - 31 දිනට වයස අවුරුදු 13ට අඩු විය යුතු අතර අවුරුදු 11 හෝ අවුරුදු 11ට වැඩි විය යුතු ය.

15න් පහළ තරග, 2016 - 03 - 31 දිනට වයස අවුරුදු 15ට අඩු විය යුතු අතර අවුරුදු 13 හෝ අවුරුදු 13ට වැඩි විය යුතු ය.

17න් පහළ තරග 2016 - 03 - 31 දිනට වයස අවුරුදු 17ට අඩු විය යුතු අතර 15 හෝ අවුරුදු 15ට වැඩි විය යුතු ය.
සිසුන් කීපදෙනකුගේ උපන්දින පහත දැක්වේ.

නම	උපන්දිනය
චන්දුල	2005 - 12 - 08
හෂාන්	2002 - 05 - 17
හසින්ත	2000 - 01 - 16

එක් එක් සිසුවා සුදුසුකම් ලබන්නේ කවර වයස් සීමාවේ තරග සඳහා දැයි සොයා දක්වන්න.

2.

I. චන්දුල - අවුරුදු 10 මාස 03 දින 23
∴ 11න් පහළ තරග

II. හෂාන් - අවුරුදු 13 මාස 10 දින 14
∴ 15න් පහළ තරග

III. හසින්ත - අවුරුදු 16 මාස 02 දින 15
∴ 17න් පහළ තරග

සිතන්න

(1) 2002 - 09 - 23 දින පෙ.ව. 9.32ට උපත ලැබූවකු 2015 - 06 - 05 දින මධ්‍යාහ්න 12 තෙක් ජීවත් වී ඇති කාලය නිවැරදිව අවුරුදු, දින, පැය සහ මිනිත්තුවලින් සොයන්න.

(2) උපතේ සිට දින 20591ක් ජීවත් වූ අයකු මිය යන විට ඔහුගේ වයස අවුරුදු, මාස සහ දිනවලින් සොයන්න.

1. අවුරුදු 12 මාස 08 දින 26 පැය 02 මිනිත්තු 28
2. අවුරුදු 56 මාස 05 දින 01

පිළිතුරු

Answer

නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda

නාලන්දා විද්‍යාලය - කොළඹ 10
ගණිතය - 2020
7 - ශ්‍රේණිය

කාලය : පැය 01 යි

6 - කාලය

(1) පහත දැක්වෙන එක් එක් වර්ෂය අයත් වන්නේ කීවෙනි දශකයට දැයි ලියා දක්වන්න.

(i) ක්‍රි. ව. 1752 (ii) ක්‍රි. ව. 1908 (iii) ක්‍රි. ව. 2005 (iv) ක්‍රි. ව. 1534

(2) පහත දැක්වෙන එක් එක් වර්ෂය අයත් වන්නේ කී වන සියවසට දැයි ලියන්න.

(i) ක්‍රි. ව. 1835 (ii) ක්‍රි. ව. 1786 (iii) ක්‍රි. ව. 2021 (iv) ක්‍රි. ව. 2005

(3) අධික අවුරුදු වන වර්ෂ තෝරා ලියන්න.

(i) ක්‍රි. ව. 1954 (ii) ක්‍රි. ව. 1600 (iii) ක්‍රි. ව. 2048 (iv) ක්‍රි. ව. 1996

(4) පහත දැක්වෙන එක් එක් දින ගණන මාස සහ දිනවලින් දක්වන්න.

(i) දින 235 (ii) දින 154 (iii) දින 95

(5) පහත දී ඇති ගැටලු විසඳන්න.

(i)

	අවුරුදු	මාස	දින
	12	8	22
+	5	2	14
	=======	=======	=======

(ii)

	අවුරුදු	මාස	දින
	3	6	15
+	2	4	18
	=======	=======	=======

(iii)

	අවුරුදු	මාස	දින
	5	8	13
-	2	4	15
	=======	=======	=======

(iv)

	අවුරුදු	මාස	දින
	27	2	5
-	15	4	8
	=======	=======	=======

නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda

නාලන්දා විද්‍යාලය - කොළඹ 10
ගණිතය - 2020
7 - ශ්‍රේණිය

කාලය : පැය 01 යි

1.
- I. 176 දශකය
- II. 191 දශකය
- III. 201 දශකය
- IV. 154 දශකය (ලකුණු 20)

2.
- I. 19 සියවස
- II. 18 සියවස
- III. 21 සියවස
- IV. 21 සියවස (ලකුණු 20)

3. ක්‍රි. ව. 1600, ක්‍රි. ව. 2048, ක්‍රි. ව. 1996 (ලකුණු 15)

4.
- I. මාස 07 දින 25
- II. මාස 05 දින 04
- III. මාස 03 දින 05 (ලකුණු 15)

5.
- I. අවුරුදු 17 මාස 11 දින 06
- II. අවුරුදු 05 මාස 11 දින 03
- III. අවුරුදු 03 මාස 03 දින 28
- IV. අවුරුදු 11 මාස 10 දින 27 (ලකුණු 30)

6 කාලය

- **නිපුණතාව 12** : වැඩ ලෝකයේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා කාලය කළමනාකරණය කර ගනියි.
- **නිපුණතා මට්ටම 12.1 :** කාලයේ මිනුම් ඒකකය සහ අන්තරය යටතේ හසුරුවයි.
- **ඉගෙනුම් පල**
  - කාලය මැනීම සඳහා යොදා ගන්නා මාසය, අවුරුද්ද, දශකය, ශතකය, සහස්‍රකය හඳුනා ගනියි.
  - අධික අවුරුද්ද හඳුනා ගනියි.
  - දින, මාස, අවුරුදු අතර සම්බන්ධ ප්‍රකාශ කරයි.
  - කාලය මැනීමේ ඒකක, අවුරුදු → මාස ,මාස→ දින, අවුරුදු → දින ලෙස පරිවර්තනය කරයි.
  - දින හා මාස ඇතුළත් කාලයන් එකතු කරයි; අඩු කරයි.
  - මාස හා අවුරුදු ඇතුළත් කාලයන් එකතු කරයි; අඩු කරයි.
  - දින, මාස, අවුරුදු ඇතුළත් කාලයන් එකතු කරයි; අඩු කරයි

ගුරුවරයාට අදහසක්

6 ශ්‍රේණියේ දී කාලය මනින ඒකක ලෙස තත්පර, මිනිත්තු හා පැය හඳුනා ගන්නා අතර කාර්යයක් සඳහා ගතවූ කාලය සොයයි. මෙම ශ්‍රේණියේ දී තව දුරටත් කාලය මනින ඒකක ලෙස මාස, අවුරුදු, දශක, සියවස් සහ සහස්‍රක හඳුනා ගන්නා අතර කාලය සම්බන්ධ මිනුම් එකතු කිරීම අඩු කිරීම හැකියාව ලැබීමට අපේක්ෂිත අතර 8 ශ්‍රේණියේ දී කාල කලාප ඇසුරින් ස්ථානයක සම්මත වේලාව ගණනය කිරීමට අපේක්ෂිතයි.

ඉගෙනුම් පල

- **කාලය මැනීම සඳහා යොදා ගන්නා මාසය, අවුරුද්ද, දශකය, ශතකය හා සහස්‍රකය හඳුනා ගනියි.**

⌘ මේ සඳහා ක්‍රියාකාරකම් එකක් පහතින් දැක්වේ.

⌘ ගුරු අත්පොතේ පිටු අංක 53 - 56 කෙරෙහි අවධානය යොමු කරන්න.

ක්‍රියාකාරකම 01

ගුණාත්මක යෙදවුම්

- තරමක් විශාල පෙට්ටි 5ක්
- ඇමුණුම 6.1A හි සඳහන් කාඩ්පත් එක් සිසුවෙකුට එක බැගින්
- ඇමුණුම 6.1B හි සඳහන් කඩදාසි පත

ගුරු කාර්යය

- වසර 10ක කාල පරාසයක් දශකයක් ලෙස හඳුන්වා දෙමින් පාඩමට පිවිසෙන්න.
- ඇමුණුම 6.1 කාර්ය පත්‍රිකාවේ B කොටසෙහි සඳහන් කඩදාසිපත්, පෙට්ටි 5හි අළවා පන්ති කාමරයේ ප්‍රදර්ශනය වන සේ තබන්න.
- ඇමුණුම 6.1 කාර්ය පත්‍රිකාවේ A කොටසෙහි සඳහන් කාඩ්පත් එක් සිසුවෙකුට එක බැගින් ලබා දී, එම කාඩ්පතේ ඇති වර්ෂයට අනුව අදාළ කාඩ්පත සුදුසු පෙට්ටියට දමන ලෙස උපදෙස් දෙන්න.
- අවසානයේ ඒවායේ නිවැරදි භාවය සාකච්ඡා කරන්න.
- මෙම ක්‍රියාකාරකම ශතකය හා සහස්‍රක හඳුන්වා දීමටද සුදුසු වෙනස්කම් කරමින් භාවිත කරන්න.

සිසු ක්‍රියාකාරකම

- ඔබට ලැබී ඇති කාඩ්පත සුදුසු පෙට්ටියට දමන්න
- එහි ඇති නිවැරදි බව ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.

ඉගෙනුම් පල

- අධික අවුරුද්ද හඳුනා ගනියි.

⌘ මේ සඳහා ක්‍රියාකාරකමක් පහතින් දැක්වේ.

ක්‍රියාකාරකම 01

ගුණාත්මක යෙදවුම්

- තරමක් විශාල පෙට්ටි 2ක්
- ඇමුණුම 6.2 හි A කොටසෙහි සඳහන් කාඩ්පත් එක් සිසුවෙකුට එක බැගින්
- ඇමුණුම 6.2 හි B කොටසෙහි සඳහන් කඩදාසිපත්

ගුරු කාර්යය

- අධික අවුරුද්දක් යනු කුමක් දැයි හඳුන්වා දී පාඩමට පිවිසෙන්න.
- ඇමුණුම 6.2 B හි සඳහන් කඩදාසිපත් පෙට්ටි 2හි අළවා පන්ති කාමරයේ ප්‍රදර්ශනය වන සේ තබන්න.
- ඇමුණුම 6.3 A හි සඳහන් කාඩ්පත් එක් සිසුවෙකුට එක බැගින් ලබා දී, එම කාඩ්පතේ ඇති වර්ෂයට අනුව අදාළ කාඩ්පත සුදුසු පෙට්ටියට දමන ලෙස උපදෙස් දෙන්න.
- අවසානයේ ඒවායේ නිවැරදි භාවය සාකච්ඡා කරන්න.

සිසු ක්‍රියාකාරකම

- ඔබට ලැබී ඇති කාඩ්පත සුදුසු පෙට්ටියට දමන්න
- එහි ඇති නිවැරදි බව ගුරුතුමා සමග සාකච්ඡා කරන්න

ඉගෙනුම් පල

- දින, මාස, අවුරුදු අතර සම්බන්ධතා ප්‍රකාශ කරයි.
- කාලය මැනීමේ ඒකක, අවුරුදු මාස, මාස දින, අවුරුදු දින ලෙස පරිවර්තනය කරයි.

⌘ මේ සඳහා ක්‍රියාකාරකම් දෙකකි

ක්‍රියාකාරකම 01

ගුණාත්මක යෙදවුම්

- 6.3 කාර්යය පත්‍රිකාව එක් සිසුවෙකුට එක බැගින්

ගුරු කාර්යය

- 6.3 කාර්යය පත්‍රිකාව එක් සිසුවෙකුට එක බැගින් බෙදා එහි ඇති වගුව පිරවීමට උපදෙස් දෙන්න.

සිසු ක්‍රියාකාරකම

6.3 කාර්යය පත්‍රිකාව ලබාගෙන එහි ඇති වගුව සම්පූර්ණ කරන්න.

ක්‍රියාකාරකම 02

ගුණාත්මක යෙදවුම්

- ඇමුණුම 6.4 හි ඇති එකම අරය සහිත වෘත්ත ඛණ්ඩ කොටස් හා සම්පූර්ණ වෘත්තාකාර ආස්තර කිහිපයක්
- එක් සිසුවෙකුට හි වෘත්ත ඛණ්ඩ 35 ක් හා සම්පූර්ණ වෘත්තාකාර ආස්තර 4 ක් පමණ

ගුරු කාර්යය

- ඇමුණුම 6.4 හි ඇති එකම අරය සහිත වෘත්ත ඛණ්ඩ කොටස් එක් සිසුවෙකුට 12 ක් හා සම්පූර්ණ වෘත්තාකාර ආස්තර කිහිපයක් ලබා දෙන්න
- එක් එක් අවස්ථාවේ දී මාස 15 ක්, මාස 19ක්, මාස 25ක්, මාස 30 ක් ලෙස සටහන් කර එහි ඇති අවුරුදු ගණන හා මාස ගණන සටහන් කරන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- එක් වෘත්තයක් සමාන කොටස් 12 කට බෙදා ඇති බව සිසුන්ට පවසන්න.
- වෘත්ත ඛණ්ඩ කොටස් ගලපමින් වෘත්ත සෑදීමට උත්සාහ කරන මෙන් සිසුන්ට උපදෙස් දෙන්න
- 6.5 කාර්යය පත්‍රිකාව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.

සිසු ක්‍රියාකාරකම

- ඔබට ලැබී ප්‍රමාණ වලට සමාන ඇති වෘත්ත කොටස් ගලපමින් වෘත්ත සෑදීමට උත්සාහ කරන්න
- එවා භාවිතයෙන් 6.4 කාර්යය පත්‍රිකාව සම්පූර්ණ කරන්න.

ඉගෙනුම් පල

- **දින හා මාස ඇතුළත් කාලයන් එකතු කරයි අඩු කරයි.**
- **මාස හා අවුරුදු ඇතුළත් කාලයන් එකතු කරයි අඩු කරයි.**
- **දින, මාස, අවුරුදු ඇතුළත් කාලයන් එකතු කරයි අඩු කරයි.**

⌘ පෙළපොතේ 61-64 දක්වා ඇති අභ්‍යාස සිසුන් ලවා කරවන්න.

ඇමුණුම 6.1

A කොටස

1991	1993	1998	1995	1999
2002	2003	2005	2007	2008
2010	2013	2016	2017	2019
2022	2024	2026	2028	2029
1992	2004	2015	2023	2018

B කොටස

199 දශකය

200 දශකය

201 දශකය

202 දශකය

203 දශකය

A කොටස

1991	1993	1908	1996
1999	2002	2000	2005
2007	2008	2010	2012
2016	2017	2019	2400
2024	1992	2300	2500
2029	2004	2024	2018

B කොටස

අධික අවුරුද්දක් වේ

අධික අවුරුද්දක් නොවේ

ඇමුණුම 6.3

අවුරුදු 1 = මාස 12 = 12

අවුරුදු 2 = මාස 12 12 = 24

අවුරුදු 3 = මාස =

අවුරුදු 4

අවුරුදු 5

මාස 1 = දින 30 = 30

මාස 2 = දින 30 30 = 60

මාස 3 = දින =

මාස 4

මාස 5

ඇමුණුම 6.4

එක් වෘත්තයක් සමාන කේන්ද්‍රික ඛණ්ඩ 12කට බෙදා කතුරක් ආධාරයෙන් වෙන් කරන්න. එලෙස වෙන් කළ කොටස් එක් සිසුවෙකුට 35 ක් බැගින් ලැබෙන සේ බෙදා දෙන්න.









කාර්ය පත්‍රිකාව

වෘත්ත කොටස් ගණන (මාස ගණන)	සෑදිය හැකි පූර්ණ වෘත්ත ආස්තර ගණන	ඉතිරි වෘත්ත කොටස් ගණන	අවුරුදු හා මාස
15			
19			
25			
30			

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ